# කථානායකතුමාගේ නිවේදනය

2015 නොවැම්බර් මස 03 වැනි දින ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා විසින් පාර්ලිමේන්තු පරිශ්‍රය අවට ආරක්ෂාව සහ මහජනතාවට පාර්ලිමේන්තුවට පැමිණ මහජන නියෝජිතයන් හමුවීමට බාධා ඇතිවීම සම්බන්ධයෙන් මතු කරන ලද කරුණු පිළිබඳව පැහැදිලි කිරීමක් කිරීමට මම අදහස් කරමි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා මෙම කරුණ පාර්ලිමේන්තුවේ මතුකිරීමෙන් අනතුරුව මවිසින් ඊයේ දිනයේදී වැඩබලන පොලිස්පතිතුමාගෙන් සහ අදාළ ආරක්ෂක අංශවලින් මේ පිළිබඳව විමසීමක් සිදුකරන ලදී.

විශ්ව විද්‍යාල සිසුන් රාශියක් කොළඹ නගරයේ මෙන්ම පාර්ලිමේන්තු පරිශ්‍රය අවට ද විවිධ ස්ථානවල එක්රැස්වී විරෝධතාවන් හා පෙළපාලි යෑමට සංවිධානය කර ඇති බවට ඔවුන් ලද තොරතුරු මත රජයේ ආරක්ෂක අංශ විසින් අවශ්‍ය හා උචිත පරිදි ආරක්ෂක විධිවිධාන යොදා තිබුණු බවට මා වෙත වාර්තා කරන ලදී.

මහජනතාවට හෝ කිසිදු සිසුවෙකුට පාර්ලිමේන්තු පරිශ්‍රයට පැමිණීමට හෝ පැමිණ දැනට පවත්නා ක්‍රමවේදයන්ට යටත්ව ගරු මන්ත්‍රීවරයකු හමුවීමට හෝ කිසිදු බාධාවක් සිදු නොවූ බවද මා වෙත වාර්තා විය.

එසේම, ඊයේ දින, පාර්ලිමේන්තු පරිශ්‍රය වෙත පැමිණෙන කිසිදු වාහනයකට හෝ පුද්ගලයෙකුට පාර්ලිමේන්තු ප්‍රවේශ මාර්ගයේදී කිසිදු විශේෂ ආරක්ෂක පරීක්ෂාවකට ලක්කිරීමක් හෝ බාධා කිරීමක් හෝ සිදු නොකෙරුණු බවද මා වෙත වාර්තා විය.

එසේම, ඊයේ දින, පාර්ලිමේන්තු පරිශ්‍රය තුළ කිසිදු අමතර හෝ විශේෂ ආරක්ෂක විධිවිධානයක් ක්‍රියාත්මක නොවූ අතර, පාර්ලිමේන්තු පරිශ්‍රයෙන් බාහිර ආරක්ෂාව කටයුතු සැලසීමේදී ඒ පිළිබඳව මා වෙත පූර්ව දැනුම්දීමක් කිරීමට හෝ මාගෙන් පූර්ව අවසරයක් ගැනීම අනිවාර්ය නොවන බවටද මා දැනුවත් වූ අතර, මින් පෙර සිටි කථානායකතුමන්ගෙන්ද විමසා සිටි අවස්ථාවේදී එම මතය එතුමා විසින් ද තහවුරු කළ බව දන්වා සිටීමට කැමැත්තෙමි.